# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## Assignment for Vacation -2020
## ව්‍යාපාර අධ්‍යයනය

**Lesson 02**

නම / අංකය ............................................... **13 ශ්‍රේණිය**

**<u>ව්‍යාපාර සමාජීය වගකීම් සහ ව්‍යාපාර ආචාර ධර්ම</u>**

"සමාජ වගකීම් , හොඳ ව්‍යාපාර සංවේදී තාවයකි."

1) සමාජීය වගකීම් සම්බන්ධයෙන් විවිධ පුද්ගලයින් , සංවිධාන රටවල් විසින් විවිධ නිර්වචන ඉදිරිපත් කොට ඇත. එම නිරිවචන සැලකිල්ලට ගෙන ඒ සඳහා පොදු නිර්වචනයක් ඉදිරිපත් කරන්න.

2) වර්තමානයේදී ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවයන්ට මෙන්ම පොදුවේ සමාජයටද බලපෑම් කරන බලවේග කිහිපයක් වර්ධනය වෙමින් පවතී. එම නිසා ව්‍යාපාර සමාජීය වගකීම් ඉටු කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ දැඩි අවධානයක් යොමු වෙමින් පවතී.එවැනි බලවේග සඳහා උදාහරණ 04 ක් සඳහන් කරන්න.

3) "සියලුම ඇල්මැති පාර්ශවයන්ට උපරිම සාධාරණයක් වන අයුරින් කටයුතු කිරීම තුළින් සමාජීය වගකීම් ඉටු කළ හැක "මේ අනුව ව්‍යාපාරයක් මඟින් සමාජීය වගකීම් ඉටු කළ යුතු ප්‍රධාන පාර්ශවයන් නම් කරන්න.

4) පහත දැක්වෙන්නේ විවිධ පාර්ශවයන් වෙත ඉටු කළ යුතු සමාජීය වගකීම් කිහිපයකි. එම වගකීම් එම පාර්ශවයන් යටතේ වර්ග කොට දක්වන්න.

- සාධාරණ වීම
- සමානාත්මතාවය
- හානි අවම කිරීම.
- සාධාරණ ඉපයීමක් ලබා දීම.
- අපද්‍රව්‍ය කළමනාකරණය
- කාර්යක්ෂම ලෙස අවංක ලෙස ව්‍යාපාර කටයුතු මෙහෙය වීම.
- ආර්ථික ප්‍රතිලාභ අත්කර දීම.
- බදු ගෙවීම.
- හරිත නිෂ්පාදනය
- වෘත්තීමය ආරක්ෂාව
- ප්‍රජා සත්කාර සේවා
- සෞඛ්‍ය පහසුකම්
- සෙවා නියුක්තියට දායක වීම.
- පරිසර හිතකාමී ලෙස කටයුතු කිරීම.
- මනා සේවක සම්බන්ධතා
- අයිතිවාසිකම් ආරක්ෂා කර දීම.

5) "සමාජ වගකීම් ඉටු කරන ව්‍යාපාරයක් රටක හොඳ පුරවැසියෙකු ලෙස සැලකේ."ඒසේ සමාජ වගකීම් ඉටු කිරීමෙන් ව්‍යාපාරයකට අත් කර ගත හැකි ප්‍රතිලාභ මොනවාදැයි දක්වන්න.
6) තිරසාර සංවර්ධනය යනු කුමක්ද?
7) තිරසාර සංවර්ධනය ලබා ගැනීම සඳහා අවධානය යොමු කළ යුතු ප්‍රධාන ක්ෂේත්‍ර නම් කරන්න.
8) ආර්ථික තිරසර සංවර්ධනය මඟින් රටක් අපේක්ෂා කරන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.
9) තිරසර සංවර්ධනයේ අපේක්ෂාවන් ඉටු කර කර ගැනීම සඳහා පරිසර තිරසර ආරක්ෂණය වැදගත්වේ.ඊට මෙය කෙසේ වන්නේදැයි පැහැදිලි කරන්න.
10) පාරිසරික තිරසර බව ආරක්ෂා කර ගැනීම පාරිභෝගික වන ඔබට ගත හැකි ක්‍රියා මාර්ග දක්වන්න.
11) රටක් තුළ තිරසර අනාගතයක් තහවුරු කිරීමට සමාජ තිරසර සංවර්ධනයක් තුළින් අපේක්ෂා කරන්නේ කුමක්දැයි............
12) සමාජ තිරසර සංවර්ධනයේදී තිරසර අනාගතයක් ඒම රටේ ජනතාවට තහවුරු කිරීමට නම් සැලකිලිමත් විය යුතු කරුණු නම් කරන්න.
13) තිරසර සංවර්ධනය හා සම්බන්ධ ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ.ඒම ක්‍රියාකාරම් ආර්ථික , පරිසර හා සමාජ තිරසර බව යටතේ වර්ග කොට දක්වන්න.
    - රැකියා නිර්මාණය
    - පරිසර හිතකාමී බල ශක්ති භාවිතය
    - පස දූෂණය අඩු කිරීම.
    - සමාජ සංරක්ෂණ කටයුතු කිරීම.
    - අවධානම් කළමනාකරණය කිරීම.
    - තාක්ෂණය දියුණු කිරීම.
    - මානව විවිධත්වයට ගරු කිරීම.
    - ප්‍රාග්ධන කාර්යක්ෂමව භාවිතය
    - මානව අයිතිවාසිකම් සුරැකීමට දායක වීම.
    - පරිසර හිතකාමී ප්‍රවාහන ක්‍රම භාවිතය
    - නවෝත්පාදනය හඳුන්වා දීම
    - නිෂ්පාදන ක්‍රියාවලිය දිරි ගැන්වීම.
    - නීතිය හා සාමය සුරැකීමට දායක වීම .
    - පරිසර නීති වලට කටයුතු කිරීම.
    - ජෛව විවිධත්වය රැකීමට කටයුතු කිරීම.

14) තිරසාර සංවර්ධනය සඳහා ව්‍යාපාර නූතනයේ භාවිතා වන 4 R සංකල්පය හඳුන්වන්න.

15) 4 R සංකල්පය තුළ නියෝජනය වන ප්‍රධාන විචල්‍යයන් නම් කොට ඒය ක්‍රියාත්මක කිරීමට අදාළ උදාහරණය බැගින් දක්වන්න.

16) 4 R කල්පයට අනුව “නැවත ස්ථාපිත කිරීම ”(Replace ) යටතේ සිදුවන්නේ නිෂ්පාදනයේදී භාවිතා කරන ස්වභාවික සම්පත් වලින් නැවත ස්ථාපිත කළ හැකි සම්බත් පරිසරය තුළ නැවත ස්ථාපිත කිරීමයි.

I. ඒසේ නැවත ස්ථාපිත නොහැකි සම්පත් තිබේද?තිබේනම් ඊට උදාහරණ සඳහන් කරන්න.

II. පරිසර තිරසර ආරක්ෂණයේදී ඒම සම්පත් සුරැකීම සඳහා ගත හැකි ක්‍රියා මාර්ග සඳහන් කරන්න.

“අංක ඒකේ ආචාර්ය ධර්ම ලෙස සඳහන් කරන්නුයේ ගරු කිරීම යන්නයි.”අන්‍යන්ට ගරු කිරීම සෑම පුද්ගලයෙකුගේම යුතුකමකි..ආචාර්ය ධර්මයකි.

17) ව්‍යාපාර ආචාර්ය ධර්ම සංකල්පය හඳුන්වන්න.

18) වර්තමානයේ උද්ගතවී ඇති කොරෝනා උවදුරු තත්ත්වය තුළ ඔබ පාරිභෝගික භාණ්ඩ සිල්ලරට අලෙවි කරන ව්‍යාපාරිකයෙකු නම් තම පාරිභෝගිකයින් වෙනුවෙන් පිලිපැදිය යුතු ආචාර පද්ධතියක් සඳහන් කරන්න.

19)

I. “ආචාර්ම ධර්ම සංග්‍රහය ”යන්න හඳුන්වන්න.

II. මෙමගින් ව්‍යාපාරයක් අපේක්ෂා කරන්නේ කුමක්දැයි යන්න දක්වන්න.

20) ව්‍යාපාරයක් විසින් ආචාර්ය පද්ධතියක් සකස් කිරීමේ දී අවධානය යොමු කරන ව්‍යාපාර ක්ෂේත්‍රයන් 04 ක් නම් කරන්න.

21) ව්‍යාපාරයක් වීසින් ආචාර ධර්ම පද්ධතියක් සකස් කිරීමේදී අවධානය යොමු කරන ව්‍යාපාර ක්ෂේත්‍රයන් 4 ක් නම් කරන්න.

22) ව්‍යාපාර ආචාර ධර්ම පද්ධතියක් ගොඩනැගීමේදී අවධානය යොමු කරන කරුණු සඳහන් කරන්න.

23) යම් ව්‍යාපාරයක් ආචාර් ධර්ම වලට අනුකූලව කටයුතු කිරීමක් ලෙස හඳුන්වන්නේ කුමන තත්ත්වයන් ඉටු කිරීමෙන්ද ?ඒවැනි තත්ත්වයන් නම් කරන්න.

24) සමාජ වගකීම් නිර්වචනය කිරීමේ දී “ව්‍යාපාර සමාජයට ආපසු දෙන දෑ” සමාජ වගකීම් ලෙස නිර්වචනය නිර්වචනය කරනුයේ...............................................විසිනි.

25) ව්‍යාපාරයක් කොටස්කරුවන්ට පමණක් නොව ඉන් ඔබ්බට ගොස් ............................................ සමාජ වගකීම් ඉටු කළ යුතුය.

26) පරිසරය හා සංවර්ධනය පිළිබඳ වූ ඒක්සත් ජාතීන්ගේ සම්මේලනය ...................................යනුවෙන් කෙටියෙන් හඳුන්වයි.

27) යම් පුද්ගලයෙකුට ,රටකට අයත් ස්වභාවික භූමියක පරිසරය හෝ සංස්කෘතිකය කෙලසන කිසිඳු කටයුක්තක් පවත්වාගෙන නොයන බවට ...........................................තුළදී සමාජික රටවල් ඇති කර ගන්නා ලද ගිවිසුම........................................ලෙස හඳුන්වයි.

28) පරිසර සංවර්ධනයේදී සම්පත් පරිභෝජනය අඩුකර ජීවන තත්ත්වය උසස් කිරීම මඟින් මානව සුභසාධනය ඉහළ නැංවීම...................................මඟින් අපේක්ෂා කෙරේ.

29) සමාජ තිරසර සංවර්ධනය සහ පාරිසරික තිරසර ආරක්ෂණය මඟින් .............................ත්,පාරිසරික හා ආර්ථික තිරසර සංවර්ධනය මඟින් .................................ත් ,සමාජ හා ආර්ථික ලිරසර සංවර්ධනය තුළින් ..................................................ත් ,ලභා කර ගත හැක.

30) 4R සංකල්පයේදී පානීය ජලය ප්ලාස්ටික් ඇසුරුම්වල ගබඩා නොකිරීම...................................යටතට ගැනේ.

31) ඉවතලන ද්‍රව්‍ය හෝ අපතේ යන ද්‍රව්‍ය පරිසරයට මුදා නොහැර ඒය නිෂ්පාදනයක් වෙත යොමු කිරීම.......................ලෙස හැඳින්වේ.

32) ව්‍යාපාරයක් විසින් සමාජ වගකීම් ඉටු කිරීමේදී ප්‍රමුඛතාවය ලබා දිය යුතු ප්‍රධාන අංශ 04ක් ලෙස ඒක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින ප්‍රකාශයට පත් කර ඇති අංශ වනුයේ,

............................................... ...........................................

............................................... ...........................................